www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ඉන්දියානු-පකිස්ථාන යුද ආතතිය දිගටම පවතී

## Tense India-Pakistan standoff continues

**පීටර් සිමන්ඩ්ස් විසිනි**
**2008 දෙසැම්බර් 8**

පසුගිය මාසයේ මුම්බායි ත්‍රස්ත ප්‍රහාරවලට වගකිව යුතු යයි කියනු ලබන ඉස්ලාම්වාදී කන්ඩායම්වලට එරෙහිව ක්‍රියාමාර්ග ගන්නා ලෙස බුෂ් පාලනාධිකාරය පකිස්ථානය මත තියුනු පීඩනයක් යොදමින් සිටී. වොෂිංටනය නව දිල්ලියට දෙන පිටුබලය, පකිස්ථානය හා ඉන්දියාව අතර ආතතීන් සමනය කරනවා නොව, පකිස්ථානය තව දුරටත් අස්ථාවර කිරීමේ ද කලාපීය ප්‍රතිවාදීන් අතර ගැටුම උත්සන්න වීමේ ද තර්ජනය මතු කරයි.

පසුගිය සතියේ නව දිල්ලියට ද ඉන් පසුව ඉස්ලාමාබාද් නුවරට ද ගිය එක්සත් ජනපද රාජ්‍ය ලේකම් කොන්ඩලීසා රයිස්, "ත්‍රස්තවාදය හා ත්‍රස්තවාදීන් මුලිනුපුටා දැමීමට" ඇති කැපවීම මත දිගටම ක්‍රියාත්මක වීමට පකිස්ථානයට සිදු වන බව ඊයේ *ඒබීසී නිව්ස්* ප්‍රවෘත්ති සේවයට පැවසුවා ය. මුම්බායි ප්‍රහාර සිදු කරනු ලැබ ඇත්තේ "රාජ්‍ය-නොවන ක්‍රියාකාරීන්" විසිනි යන තර්කය තමා "පිලිගත නොහැකි" එකක් ලෙස ප්‍රතික්ෂේප කර ඇති බව ඇය කියා සිටියේ, එය "කොහොම වුනත් ඔබගේ වගකීම" යයි පකිස්ථාන නිලධාරීන්ට පවසමිනි.

රයිස් මෙසේ අවධාරනය කලා ය: "මෙය පකිස්ථානය ක්‍රියාත්මක විය යුතු අවස්ථාවක්. ඔවුන් ක්‍රියාත්මක විය යුත්තේ ඉන්දියාව සමග, එක්සත් ජනපදය සමග, ඒකාබද්ධව. "මිලිටරි ක්‍රියාමාර්ග ගැනීමේ අයිතිය ඉන්දියාවට පවතී ද යනුවෙන් විමසූ කල, ඉන්දියාවේ කෝපය හා අසහනය තමාට අවබෝධ කර ගත හැකි පැවසූ ඇය මෙසේ ද කියා සිටියා ය: "ඒත් මේ කාරනාවේ දී, ඉන්දියාවට ගත හැකි, තත්වය වඩා නරක අතට හැරෙන, ක්‍රියාමාර්ග තියෙනවා. ඉතින් දකුනු ආසියාවේ අර්බුදයක් අපට අවශ්‍ය නැහැ."

පකිස්ථානය ක්‍රියාමාර්ග ගැනීමට අපොහොසත් වුව හොත් පකිස්ථානයට එරෙහිව ජාත්‍යන්තර දන්ඩන පනවන බවට රයිස් තර්ජන කර ඇතැයි පකිස්ථානයේ *ඩෝන්* පුවත්පතේ සෙනසුරාදා පල වූ ලිපියක් සඳහන් කලේ ය. පකිස්ථානු අගමැති, ජනාධිපති හා හමුදා ප්‍රධානියා ඇතුලු අය සහභාගි වූ හමුවක දී, එක්සත් ජනපද රාජ්‍ය ලේකම් "අපරාධකරුවන් ගැන වග බලා ගන්නා ලෙස පකිස්ථාන නායකයන්ට බල කල" බවත් "නැතිනම් එක්සත් ජනපදය ක්‍රියාමාර්ග ගන්නා" බවත් පැවසුවේ යයි වාර්තා විය. "එය පිලිබඳ සත්‍ය තතු සොයාගැනීමේ හදිසි භාවය" ද "සඵල හා සංකේන්ද්‍රිත ප්‍රතිචාරයක අවශ්‍යතාව ද ඇය අවධාරනය කලා ය.

මුම්බායි ප්‍රහාර සිදු කල බවට චෝදනා එල්ල වී ඇති ලෂ්කාර්-ඉ-තායිබා නම් කාශ්මීර බෙදුම්වාදී කන්ඩායමට එරෙහිව ක්‍රියාමාර්ග ගැනීමේ සැලසුමක් සකසනු පිනිස ඉන්දියාව හා එක්සත් ජනපදය ලබා දුන් පැය 48ක කාල සීමාවට ඉස්ලාමාබාද් පාලනය එකග වී ඇතැයි ඉහල පෙලේ පකිස්ථාන නිලධාරියෙක් පැවසුවේ යැයි *වොෂිංටන් පෝස්ට්* වාර්තා කලේ ය. පසුව එක්සත් ජනපද හා පකිස්ථාන නිලධාරීන් විසින් එම වාර්තාව ප්‍රතික්ෂේප කරන ලදි. ප්‍රහාරවලට සම්බන්ධිත යයි කියනු ලබන අඩු ගනනේ පකිස්ථානුවන් තිදෙනෙක් අත් අඩංගුවට ගත යුතු බවට ද රයිස් අවධාරනය කල බව එම නිලධාරියා පැවසී ය.

එක්සත් ජනපද හා ඉන්දියානු ඉල්ලීම්වලට හිස නමන ලෙස පකිස්ථාන ආන්ඩුවට බල කරනු පිනිස, වොෂිංටනය, ඉන්දියානු මිලිටරි ක්‍රියාමාර්ග මෙන් ම නිශ්චිතව විස්තර නොකෙරුනු ඇමරිකානු දන්ඩන ක්‍රියාමාර්ග ද පිලිබඳ තර්ජනය පැහැදිලිව ම යොදා ගනී. තමන්ගේ පාර්ශ්වයෙන්, ඉන්දියාව, පකිස්ථානු-පාලිත කාශ්මීරය තුල පවතින කඳවුරුවල සිට ක්‍රියාත්මක වන සන්නද්ධ ඉස්ලාම්වාදී හා කාශ්මීර බෙදුම්වාදී කන්ඩායම්වලට එරෙහි ක්‍රියාමාර්ග සඳහා බල කරනු පිනිස මුම්බායි ජන ඝාතන ගසාකයි. පසුගිය දශක දෙකක කාලය තිස්සේ, ඉන්දියානු මිලිටරිය, කාශ්මීරයේ ඉන්දියානු පාලනයට විරුද්ධ කාශ්මීර සටන්කාමීන්ට එරෙහිව ක්ෂමා විරහිත හා සාමාන්‍යයෙන් ම්ලේච්ඡ කැරලි විරෝධී යුද්ධයක් ගෙන යමින් සිටී.

එක්සත් ජනපදය සම්බන්ධයෙන් ගත හොත්, කලාපය තුල සිය ආර්ථික හා මූලෝපායික අවශ්‍යතාවන්ට තර්ජනය කරන සහ විශේෂයෙන් ම ඇෆ්ඝනිස්ථානයේ සිය මිලිටරි වාඩිලෑම ස්ථාවර කර ගැනීමේ ප්‍රයත්නයන්ට වල කපන ආකාරයේ" අර්බුදයක්" න්‍යෂ්ටිකව-සන්නද්ධ බලවතුන් දෙදෙනා අතර හටගැනීම වලකාලීමට ඔවුන්ට නිසැකව ම අවශ්‍ය ය. ඇෆ්ඝනිස්ථානයට යාබද ප්‍රදේශ තුල ක්‍රියාත්මක වන එක්සත් ජනපද විරෝධී කැරලිකරුවන්ට එරෙහි සිය මෙහෙයුම් ඉහල දමන ලෙස පකිස්ථාන මිලිටරියට අවධාරනය කරනු පිනිස

රයිස් මෙම අවස්ථාව යොදා ගත් බවට සැකයක් නැත. ඉන්දියාවෙන් එල්ල වන මිලිටරි තර්ජනයකට ප්‍රතිචාර වසයෙන් පකිස්ථාන හමුදා ඇෆ්ඝනිස්ථාන දේශ සීමාවේ සිට ඉන්දියානු දේශ සීමාව දෙසට අපසරනය කිරීමක් වලකාගැනීමට එක්සත් ජනපදයට අවශ්‍ය ය.

නොවැම්බර් 28 දා පකිස්ථාන ජනාධිපති අසිෆ් අලි සර්දාරිට ලැබුනු තර්ජනාත්මක දුරකතන ඇමතුමකින් පසුව පකිස්ථාන ගුවන් හමුදාව පැය 24 තිස්සේ අධි සීරුවෙන් තැබූ බවට පසුගිය සති අන්තයේ පල වූ වාර්තා මගින් නව දිල්ලිය හා ඉස්ලාමාබාද් අතර සබඳතා කෙතරම් නම් ආතති සහගත ද යන වග අවධාරනය කෙරුනි. තමා ඉන්දියානු විදේශ ඇමති ප්‍රනාබ් මුඛර්ජී යයි කියා සිටි තැනැත්තෙක් දුන් දුරකතන ඇමතුම ඉස්ලාමාබාද්හි අර්බුද රැස්වීමකට ද ඉන්දියානු දේශ සීමාව දෙසට හමුදා මාරු කිරීමේ තර්ජනයකට ද තුඩු දුන් බව සෙනසුරාදා ඩෝන් පුවත්පත වාර්තා කලේ ය.

පසුව දෙපාර්ශ්වය විසින් ම ව්‍යාජ එකක් ලෙස පිලිගනු ලැබ ඇති දුරකතන සංවාදය ම, චෝදනා හා ප්‍රති-චෝදනා ප්‍රවාහයක් අවුලුවා ඇත. තමන් එවන් ඇමතුමක් නොදුන් බව පවසා ඇති මුඛර්ජී එය පැමිනියේ ඉන්දියානු විදේශ කටයුතු අමාත්‍යාංශයෙන් ය යන පකිස්ථානු කියාපෑම ද ප්‍රතික්ෂේප කර තිබේ. මුම්බායි ප්‍රහාරවලින් අවධානය අපසරනය කරනු වස් පකිස්ථානයේ මිලිටරි ඔත්තු අංශය වන අන්තර්-සේවා ඔත්තු ඒජන්සිය (අයිඑස්අයි) එම දුරකතන ඇමතුම දුන්නේ යයි ඉන්දියානු නිලධාරීන් චෝදනා කර ඇත. ඇමතුම දුන්නේ කවුරුන් ද යන්න පැහැදිලි නැත. එහෙත් එයට, මිලිටරි ගැටුමක් අවුලුවාලීමේ අභිප්‍රායෙන් යුක්ත, ඉන්දියාවේ හෝ පකිස්ථානයේ, රාජ්‍ය යන්ත්‍රනයේ දැඩි මතධාරී කොටස්වල සම්බන්ධයක් බැහැර කල නොහැකි ය.

ඉන්දියාව හා පකිස්ථානය අතර ගැටුම් හටගැනීමේ අන්තරාය කිසිසේත් ම පහව ගොස් නැත. ලබන වසරේ දී ජාතික මැතිවරනවලට මුහුන දෙන ඉන්දියානු ආන්ඩුව, පකිස්ථානයෙන් පලිගන්නා ලෙස හින්දු අන්තවාදී පක්ෂවලින් හා කන්ඩායම්වලින් එල්ල වන පීඩනයට ද නතුව සිටී. මුම්බායි ප්‍රහාර සැලසුම් කල ලෂ්කාර්-ඉ-තායිබා ක්‍රියාකාරින් හඳුනාගෙන ඇති බව ද එයට අයිඑස්අයිහි සම්බන්ධය පිලිබඳ සාක්ෂ්‍ය තමන් සතුව ඇති බව ද ඉන්දියානු නිලධාරිහු කියාපාති. නව දිල්ලිය ඉස්ලාමාබාද් සමග පැවති සාකච්ඡා මේ වන විටත් අත්හිටුවා ඇති අතර “ත්‍රස්තවාදී පුහුනු කඳවුරුවලට” එරෙහිව මිලිටරි ප්‍රහාර එල්ල කිරීමේ හැකියාව බැහැර කොට නැත.

සිකුරාදා පකිස්ථාන නායකයන් හමු වූ එක්සත් ජනපද සෙනෙට් නියෝජිත කන්ඩායමක සාමාජික සෙනෙට් සභික ජෝන් මැකෙන් දැක්වූ අදහස් පකිස්ථානයේ *ඩේලි ටයිම්ස්* පුවත්පත ඊයේ වාර්තා කලේ ය. මැකෙන් ඒ වන විට නව දිල්ලියේ සංචාරයක් නිම කොට තිබුනා පමනි. ඔහු පුවත්පතට කියා සිටියේ පකිස්ථානය ක්‍රියාමාර්ග නොගත හොත් ඉක්මන් ක්‍රියාමාර්ග නොගත හොත්, ඉන්දියාව පකිස්ථානය තුල ගුවන් ප්‍රහාර එල්ල කල හැකි බව යි. “ඉන්දියාවේ ප්‍රජාතන්ත්‍රවාදී ආන්ඩුව සිටින්නේ පීඩනය යටතේ. ත්‍රස්තවාදීන්ට එරෙහිව ක්‍රියාමාර්ග ගන්න ඉස්ලාමාබාද් පාලනය අසමත් වුව හොත්, ඔවුන් පකිස්ථානයට සාක්ෂ්‍ය සම්පාදනය කලාටත් පස්සේ, බලයේ විකල්පය යොදා ගැනීම කාලය පිලිබඳ ප්‍රශ්නයක් වේවි.” යයි ඔහු පැවසී ය.

පකිස්ථානය තුල පාදක සමහර ත්‍රස්තවාදී පොදු කාර්ය ව්‍යුහයන් හා පුද්ගලයන් “මුලුමනින් ම විනාශ කිරීමේ” ඉන්දියාව සෘජුව ම නිමග්න වනු ඇති බවට ඉහල ම මට්ටම්වල තීන්දුවක් ගෙන ඇතැයි ඉන්දියාවේ ස්වදේශ අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ නිලධාරියකු පැවසුවේ යයි *ඒසියා ටයිම්ස්* වෙබ් අඩවියේ සෙනසුරාදා පල වූ ලිපියක් සඳහන් කලේ ය. එම නිලධාරියා සැඳහුම් කලේ, පකිස්ථානයේ ප්‍රති-ප්‍රහාරයක් හා විවෘත යුද්ධයක් වලකාගැනීමේ ප්‍රයත්නයක් ලෙස ඔත්තු ඒජන්සිවල පිටුබලය සහිතව ප්‍රභූ ඒකක යොදා ගෙන එල්ල කෙරෙන අවෘත ප්‍රහාරවලට ය. මෙහෙයුම්, පකිස්ථානු-පාලිත කාශ්මීරය පමනක් නොව පංජාබ් පලාතේ දේශ සීමා ප්‍රදේශ ද ආවරනය කරමින් මෙන් ම පකිස්ථාන වෙරල තීරුව සුපරීක්ෂාකාරිත්වයට ලක් කරමින් පුලුල් පරාසයක් අත්පත් කරගනු ඇත.

ඊලගට කුමක් සිදු වනු ඇත් ද යන වග පැහැදිලි නැත. පකිස්ථානයට එල්ල වන ඉන්දියානු ප්‍රහාරවලට එක්සත් ජනපදය කෙසේ ප්‍රතිචාර දක්වනු ඇති ද යන්න විමසූ කල මැකේන් *ඩේලි ටයිම්ස්* පුවත්පතට පැවසුවේ, වොෂිංටනය වැඩි යමක් කිරීමට අසමත් වනු ඇති බවයි. සැප්තැම්බර් 11 ප්‍රහාරවලට ඉක්බිතිව එක්සත් ජනපදය ඇෆ්ඝනිස්ථානය ආක්‍රමනය කිරීමට සැඳහුම් කරමින් ඔහු මෙසේ පැවසී ය: “අප එසේ කර ඇති කොන්දේසි යටතේ ක්‍රියාමාර්ග නොගන්නා ලෙස ඉන්දියාවෙන් ඉල්ලා සිටින්න අපට බැහැ.” මැකේන් බුෂ් පාලනාධිකාරය වෙනුවෙන් කතා නොකරන නමුත්, ඔහු නිසැකව ම ප්‍රතිරාවය කරන්නේ ධවල මන්දිරයේ මනෝගතිය වන අතර, වඩා යුදකාමී ආස්ථානයක් ගනු පිනිස ඉන්දියාව දිරිගැන්වීමට පමනක් එය පෙරලා තුඩු දෙයි.

2001 දෙසැම්බරයේ දී ඉන්දියානු පාර්ලිමේන්තු ගොඩනැගිල්ලට එල්ල වූ කාශ්මීර බෙදුම්වාදීන්ගේ ප්‍රහාරයකට පසුව, ඉන්දියාව ලක්ෂ පහක අධි-සන්නද්ධ හමුදා භට පිරිසක් පකිස්ථානු දේශ සීමා කලාපයට යවා 1947 සිට ඒ වන තෙක් පැවති සිවු වන ඉන්දු-පකිස්ථාන යුද්ධයක මුව විටට උප-මහාද්වීපය ගෙන ආවේ ය. ඉන්දියානු හමුදා බලමුලු ගැන්වීමක් සඳහා පැහැදිලි හා වියදම් අධික පියවර තව දුරටත් අවශ්‍ය නොවේ යයි ඊයේ හින්දු පත්‍රයේ පල වූ ලිපියක් සටහන්

කලේ ය. 2001-2002 ගැටුමට ඉක්බිතිව, ඉන්දියානු මිලිටරිය, අනතුරු ඇඟවීමකින් තොරව වඩා ශීඝ්‍රයෙන් ප්‍රතිචාර දක්වනු පිනිස "ශීතල ආරම්භය" නම් වූ නව පිලිවෙතක් සම්මත කර ගත්තේ ය.

පකිස්ථානය මත එල්ල වන එක්සත් ජනපද පීඩනය පහසුවෙන් ම ආපසු කැරකී ආ හැකි ය. ඉරාකයේ හා ඇෆ්ගනිස්ථානයේ එක්සත් ජනපද මිලිටරි වාඩිලෑම් සම්බන්ධයෙන් පකිස්ථානුවන් අතර මේ වන විටත් පුලුල්ව පැතිරුනු සතුරු භාවයක් හා වෛරයක් පවතින අතර පකිස්ථානයේ ගෝත්‍රික දේශ සීමා ප්‍රදේශවලට නැවත නැවතත් එල්ල කෙරෙන එක්සත් ජනපද ප්‍රහාර මගින් එය තවත් උග්‍ර කරනු ලැබ ඇත. ඉන්දියාව සමග දශක ගනනාවක් තිස්සේ ආතති පවතින තතු යටතේ, බොහෝ පකිස්ථානුවෝ මුම්බායි ප්‍රහාර සම්බන්ධයෙන් ඉන්දියාව එල්ල කරන චෝදනා ප්‍රවාහය ගැන ගැඹුරින් ම සැක කරති. ඉන්දියානු හා එක්සත් ජනපද ඉල්ලීම්වලට හිස නැමීමට පකිස්ථාන ආන්ඩුවට බල කිරීම, එහි බිඳෙන සුලු සහයෝගී පදනම්වලට තව දුරටත් වල කපා දේශපාලන අර්බුදයක තර්ජනය මතු කිරීමට පමනක් තුඩු දෙනු ඇත.

ස්වාධීනත්වයේ සිට මේ දක්වා පැවති වසර 60කට වැඩි කාල පරිච්ඡේදය තිස්සේ, ඉන්දියාවේ හා පකිස්ථානයේ දේශපාලන සංස්ථාපිතයන්, ජනගහනයේ අති මහත් බහුතරයන් මුහුන දෙන ප්‍රගාඪ සමාජ හා ආර්ථික ගැටලු විසඳලීමේ සිය නොහැකියාවෙන් මහජන අවධානය අපසරනය කරනු වස් වර්ගෝත්තමවාදය හා මිලිටරිවාදය යලියලිත් යොදා ගෙන තිබේ. වත්මන් ගෝලීය ආර්ථික අර්බුදය මධ්‍යයේ, දෙරටේ ම ආන්ඩු, එම අරමුනු සඳහා ම මුම්බායි ත්‍රස්ත ප්‍රහාරවලින් ඉක්බිති ආතති සහගත තත්වය ගසා කති. වොෂිංටනයේ මැදිහත්වීම මගින් සිදු වන්නේ ආතතීන් සමනය කිරීම නොව, මිලිටරි ගැටුමක අන්තරාය තවත් ඉහල දැමීම පමනි.

© www.wsws.org